# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,922/1 — 1970 සැප්තැම්බර් 5 වැනි සෙනසුරාද — 1970.9.5

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)

## පළාත් පාලන දන්වීම්

අ. ආ. කා. අංකය : එක්ස්. 37/66

ඇල්. ඩී.—බී. 42/57

### මහා නගර සභා ආඥා පනත

### ආඥාව

1959 අංක 12 දරණ පනතින් හා 1968 අංක 42 දරණ පනතින් සංශෝධිත (252 වෙනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතෙහි 277 වෙනි වගන්තියෙහි (2) (අ) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අග්‍රාණ්ඩුකාරවර විලියම් ගොපල්ලව වන මම, මෙ ආඥාවෙන්,

(අ) මහනුවර මහා නගර සභාව වෙත හෝ එහි නගරාධිපතිවරයා වෙත ඒ ආඥා පනතින් හෝ අන්කිසි ලිඛිත නීතියකින් පැවරී ඇති හෝ නියමිත හිමි කර ඇති සියළු අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, යුතුකම් හා කාර්‍ය පාවිච්චි කිරීම, ඉෂ්ට කිරීම හා ක්‍රියාවේ යෙදීම සඳහා විශේෂ කොමසාරිස්වරුන් ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස් ලේකම් වසම් ගොඩවින් සිරිවර්ධන මහතා සහ උඩරට ගැමි පුනරුත්ථාපන කොමිසමේ කොමසාරිස් මුතු බණ්ඩාර සමරකෝන් මහතා ද පත් කරමි. තවද,

(ආ) 1970 සැප්තැම්බර් මස 6 වෙනි දින මෙම ආඥාව ක්‍රියාවේ යෙදිය යුතු ලෙස ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාරවරයා.

1970 සැප්තැම්බර් මස 5 වෙනි දින,
කොළඹ දී ය.

9–528

---

### ගමසභා ආඥා පනත

### 17 වැනි වගන්තිය යටතේ දන්වීමයි

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගමසභා ආඥා පණතේ (257 වැනි අධිකාරිය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හම්බන්තොට දිසාවේ පළාත් පාලන සහකාර කොමසාරිස් හෙලකුමාරගේ පැරකුම් විජේසිංහ වන මා විසින් මෙයට යා කොට ඇති උප ලේඛනයෙහි පළමුවෙනි තීරුවෙහි දක්වෙන ගම සභාවේ ප්‍රථම රැස්වීම, එකී උප ලේඛණයෙහි දෙවැනි තීරුවෙහි අනුරූපිකව දක්වෙන නියමිත දිනයෙහි දී ද, එකී උප ලේඛණයෙහි තෙවෙනි තීරුවෙහි අනුරූපිකව දක්වෙන නියමිත වේලාවට ද, එකී උප ලේඛණයෙහි සිව්වෙනි තීරුවෙහි අනුරූපිකව දක්වෙන නියමිත ස්ථානයේ දී ද, මෙයින් කැඳවා සිටිනු ලැබේ.

පැරකුම් විජේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්.
හම්බන්තොට දිසාව.

1970 සැප්තැම්බර් මස 1 වැනි දින,
පළාත් පාලන අමාත්‍යාංශයේ,
හම්බන්තොට කාර්යාලයේ දී ය.

### උපලේඛණය

| පළමුවෙනි තීරුව<br>ගමසභාවේ නම | දෙවෙනි තීරුව<br>දිනය | තෙවෙනි තීරුව<br>වේලාව | සිව්වෙනි තීරුව<br>ස්ථානය |
|---|---|---|---|
| වීරකැටිය ගමසභාව ... ... | 1970.9.11 ... | පෙ. ව. 10.00 ... | වීරකැටිය ගමසභා කාර්යාලයේදී |

9–526ඒA

---


සැ. යු.—14,921/1 කාණ්ඩයේ අවසාන අති විශෙෂ ගැසට් අංකය 14,921/6 ය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.

618/1——ජේ 16575—5,500 (70/8)